# ආයතනික ජාල පරිහරණය




තනි තනි පුද්ගලයින් ලෙසින් ජාලය භාවිත කිරීම හෙවත් කේවල ජාල පරිහරණය, කවර තලයකට ව්‍යාප්තව ඇත්ද යන්න සහ එහි ව්‍යාප්ත දුර්වලතා මෙන් ම මන්දගාමී වර්ධනය ගැන ද අපි පසුගිය කලාපයකින් කරුණු කියවූයෙමු.

ජාලය පරිහරණය කරන අනෙක් ස්වරූපය වන්නේ ආයතනික ස්වරූපයයි. ආයතනික ජාල පරිහරණය කෙබඳු වේදැයි යන්න අපි දැන් සොයා බලමු.

තනි පුද්ගලයකුට පරිගණකයක් හා ඊට අදාල උපාංග ද මිල දී ගෙන ජාල සබඳතාවක් ද ලබා ගැනීම අප රට ආර්ථික පසුබිමට අනුකූලව අපහසු කර්තව්‍යයක් බව පෙර ලිපියෙන් විස්තර කෙරිනි. එහෙත් ආයතනික වශයෙන් සලකනවිට තත්ත්වය එසේම වේද? නැත. ආයතනයකට සාපේක්ෂව මේ කටයුත්ත ආර්ථික වශයෙන් එතරම් ප්‍රශ්න සහගත දෙයක් නොවේ.

ඉහළ මූල ධනයක් සහිතව ක්‍රියාත්මක වන ආයතනයකට කිසිදු ආකාරයක බරක් නොවන මෙය සාමාන්‍ය මූලධනයක් සහිතව තම කටයුතු කරගෙන යන කුඩා ආයතනයකට වුව ද පහසුවෙන් ලබාගත හැකි සේවාවකි.

රුපියල් ලක්ෂයකට අඩු වැඩි වශයෙන් ආසන්න මුදලක් මේ සඳහා ප්‍රමාණවත් වේ. එවන් මුදලක් ආයෝජනය කිරීමට නොහැකි යම්කිසි ආයතනයක් වේද යි සිතන්න. අවශ්‍ය වන්නේ පරිගණකය හා උපාංග නිවැරදි ලෙස තබා ගැනීම සඳ හා ඉඩකඩ පහසුව ලබාගැනීමත්, පරිගණකය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකරුවකු (operator කෙනෙකු) යෙදවීමත් පමණි.

ඒ අනුව ජාල පහසුකම් හා සේවාවන් ලබා ගැනීම ආයතනික මට්ටමින් බැලූ කල ඉතාමත් සරල, එමෙන් ම ආර්ථික වශයෙන් ද පහසු කටයුත්තක් බව පැහැදිලි ය. එහෙත් කේවල ජාල පරිහරණය සම්බන්ධයෙන් ප්‍රධාන ම අපහසුතාව වූයේ මෙම මූල්‍යමය බාධකය ජයගැනීමේ නොහැකියාවයි.

ආයතනික මට්ටමේ දී මෙලෙස ජාලයට සම්බන්ධ වීම පහසු හා සරල කාර්යයක් වුව ද එලෙසින්ම ජාල කටයුතු සාර්ථකව ප්‍රසාරණය වී ඇත්ද? එම සරල, බ වට සරිලන අයුරින් ජාල ක්‍රියාකාරකම් පූර්ණ වශයෙන් ප්‍රසාරණය වී නැති නමුත් ඉතාම සතුටුදායක අන්දමේ වර්ධනයක් පසුගිය වසර පහ මුළුල්ලේ ලංකාව පුරා සිදුවී ඇත.

පරිගණක වෙළෙඳුන් විසින් අද වන විට තම පරිගණක විකිණීමේ දී තෑගි කරන ප්‍රසාද උපක්‍රමයක් ලෙසට ඉන්ටර්නෙට් හා ඊමේල් සබඳතා නොමිලයේ ලබා දෙනු ලැබේ. මෙය ද ඉන්ටර්නෙට් ප්‍රචලිත වීමට මනාව බලපා




ජාලය තුළ ස්ථානගතවී ශක්තිමත්ව වැජඹෙන ආයතනික වෙබ් අඩවින්ති නිවහන් පිටු.......

ඇති කාරණයකි. තිකම් ලැබෙන 'හෙම්බිරිස්සාව' ද උනන්දුවෙන් වැළඳගන්නා පිරිසක් වන අප ඉන්ටර්නෙට් නොගතිත් ද? එතරම් පැහැදිලි අවශ්‍යතාවක් නැතත්, ලැබුණු නිසා ජාල පහසුකම් භාවිත කරන බොහෝ දෙනාට ඉතා කෙටි කල-

**අන්තර්ජාල තාක්ෂණයේ හා එහි ක්‍රියාකාරම්වල අති ධාවනකාරී වර්ධනය අපට ඒ පසුපස හඹා යා නොහැකි තරමට වේගවත්ය. මෙය විශ්වාස කළ නොහැකි තරමේ අපූර්ව තත්ත්වයකි.**

කින් අන්තර්ජාලයේ වටිනාකම පසක් වෙන්නට පටන්ගති. ක්‍රම ක්‍රමයෙන් ජාල සිසාරා යැම්වලට වැඩිපුර නැඹුරු වන බොහෝ පිරිස් තම ව්‍යාපාර (business) අවශ්‍යතාවන් මාධ්‍ය (media) අවශ්‍යතාවන් තොරතුරු (IT- Information Technology) අවශ්‍යතාවන් බහුතරයක් ඉන්ටර්නෙට් හරහා සපුරා ගැනීමට යොමු වෙති. මෙය ප්‍රසාදාත්මක වර්ධනයකි.




කුඩා, මධ්‍යම හා විශාල ආයතන බහුතර සංඛ්‍යාවක් මේ වන විට ජාල සබඳතා ලබාගෙන ඒ හරහා තම ව්‍යාපාර අවශ්‍යතා ඉටුකර ගනිමින් සිටින අතර ඉහළ මට්ටමේ ආයතන බොහොමයක් තම වෙබ් අඩවිත් බිහිකිරීමේ තත්ත්වයට වර්ධනය වෙමි ත් පවතී.

ඒ අනුව ආයතනික ජාල පරිහරණ කටයුතු ප්‍රධාන වශයෙන් දෙයාකාර වෙයි. තම ව්‍යාපාර හා තොරතුරු අවශ්‍යතාවන් උදෙසා ජාලය තුළට ඇතුළුවී ග්‍රාහක යකු, එනම් end user කෙනෙකු ලෙස කටයුතු කිරීම මූලික ආකාරයයි. තම වෙබ් අඩවිය අන්තර්ජාලය තුළ බිහිකිරීම, එනම් ජාලය තුළට පියමංකොට එහි ස්ථානගතවීම දෙවන ආකාරයයි.

මේ දෙයාකාරයේම යහපත් වර්ධනයක් මේ වනවිට සිදුවී ඇත.

ජාලයේ මාධ්‍ය කටයුතුවලට අදාළව යම් ශක්තිමත් ස්ථාවරයක් ගොඩනගා ගෙන ඇති ලේක්හවුස් ආයතනය ජාලයට පියමං කලේ ඉහත සඳහන් කළ දෙවන ආකාරයටයි. එනම් ආයතනික වෙබ් අඩවියක් බිහකිරීම හරහා ජාලය තුළ ස්ථානගත වීමයි.

අන්තර්ජාලය ලංකාවට ගොඩ බට අවදියේදී ම ජාලය වෙතට එලෙසින් පිය නැගූ ලේක්හවුස් ආයතනය ලාංකීය ජාල ක්‍රියාකාරකම්වලදී පුරෝගාමී කාර්යභාරයක් ඉටු කලේ ය. ජාල මාධ්‍ය කටයුතුවලදී පෙර ගමන්කරුවා වූයේ ලේක්හවුස් ආයතනය යි.

අද වන විට බොහෝ මාධ්‍ය ආයතන අන්තර්ජාලය තුළ ස්ථානගතව ඇතිවා පමණක් නොව ජාල තාක්ෂණය හා ගැටෙමින් ද හැපෙමින් ද සමාන්තරව යමින් ද තම ඉදිරි පියවරයන් මතිමින් සිටිති.

එහෙත් ඉන්ටර්නෙට් වැනි ඉතා සීග්‍ර ලෙසින් වෙනස්කම් සිදුවෙමින් වර්ධනය වන මාධ්‍යයකට සරිලන අන්දමේ වර්ධන සීග්‍රතාවක් ලාංකීය මට්ටමෙන් සිදුව ඇත්ද යන ප්‍රශ්නය යමෙකු නැගුවහොත් කවරකුට හෝ සිනාමුසු මුහුණකින් පිළිතුරක් දිය හැකි ද? එය අසීරු ය.

ජාල ක්‍රියාකාරකම්වල ආයතනික මට්ටමේ වර්ධන සීග්‍රතාව (rate of development) සැබැවින්ම සිදුවිය යුතු වර්ධනයට සාපේක්ෂව බලන කල මැද මට්ටමක තැන්පත්ව සිටී. එහෙත් එය කේවල ජාල පරිහරණ කටයුතුවල වර්ධනයට වඩා පැහැදිලිවම ඉහළ නැතකි.

නූත්වන ලෝකයේ දියුණු වෙමින් පවත්නා රටක් හැටියට, අපට යම් සැනසුම් සුසුමක් හෙළිය හැකි තත්ත්වයක් තිබුණ ද, අප පිය නැගිය යුතු මාර්ගය හා එහි අන්තය දෙස පරීක්ෂාවෙන් බලන කල අපට එතරම් සැනසිය හැකි නොවේ.

ආ මග කෙටි ය. යා යුතු දුර බොහෝ ය. මෙලෙස යා යුතු දුර බොහෝ වන්නේ සාමාන්‍ය සාම්ප්‍රදායික තත්ත්වයෙන් නොවේ. අන්තර්ජාල තාක්ෂණයේ හා එහි ක්‍රියාකාරම්වල අති ධාවනකාරී වර්ධනය අපට ඒ පසුපස හඹා යා නොහැකි තරමට වේගවත්ය. එබැවින් පසු කල දුරට වඩා යා යුතු දුර බොහෝ වන්නේ. මෙය විශ්වාස කළ නොහැකි තරමේ අපූර්ව තත්ත්වයකි .

ඊයේ මුළු දවස වැය කොට මහත් වෙහෙස දරා ජාල තාක්ෂණ පරිච්ඡේදයක් ඉගෙනගෙන අපි සිත් ප්‍රබෝධමත් වූයෙමු. අද උදෑසන පිබිදී ඊට අදාල ක්‍රියාකාරකම් කරන්නට සැරසෙන විට, තාක්ෂණය යල් පැන ගොස්ය. ඊයේ ඉගෙන ගත් තාක්ෂණය අද වන විට යල් පැන යන්නේ නම් ඊට එරෙහිව අපට කළ හැක් කේ කුමක් ද? අති මහත්වූ ජවයකින් එය හඹායෑම පමණී. අපගේ පාදක ව්‍යුහයන් එවන් හඹායැමකට ඔරොත්තු දෙන අන්දමට වර්ධනය වී ඇත් ද? නැතිනම් එලෙස වර්ධනය කළ හැක්කේ කවර ආකාරයට ද යන්න අද දවසේ අප මුහුණ දෙන ප්‍රධානතම ප්‍රශ්නයයි. ❑

**ඊයේ ඉගෙන ගත් තාක්ෂණය අද වන විට යල්පැන යන්නේ නම් ඊට එරෙහිව අපට කළ හැක් කේ කුමක් ද? අති මහත්වූ ජවයකින් එය හඹායෑම පමණී. අපගේ පාදක ව්‍යුහයන් එවන් හඹායෑමකට ඔරොත්තු දෙන අන්දමට වර්ධනය වී ඇත් ද? ?**

**සිරිලාලන විජේසිංහ**